# අන්‍ය ආගම්වලට හැරවීම

බෞද්ධයින් ක්‍රිස්තියානි ආගමට හරවා ගැනීමේ රහසිගත ව්‍යාපාරයක් රට තුළ පවතින බවට සමාජයේ විවිධ කොටස් තදින් මැසිවිලි නඟන්නට වී දැන් බොහෝ කලක් ගතවී තිබේ. මුලින් ඉතා රහසිගතව, සුළු පරිමානයෙන් සිදු වූ මේ ක්‍රියාවලිය දැන් දැන් එළිපිටම වාගේ සිදු කෙරෙන බවට ද සාධක දක්නට ඇත.

දරිද්‍රතාවයෙන් පෙළෙන පුද්ගලයින් වෙසෙන ප්‍රදේශ මේ 'හරවා ගැනීමේ' ව්‍යාපාරයට කදිම තෝතැන්නක් බවට පත්ව ඇත. මෙබඳු ප්‍රදේශවලින් බහුතරයක් යටිතල පහසුකම් අතින්ද නොදියුණු බවට සැකයක් නැත. මුලදී පූජ්‍ය මඩිහේ පඤ්ඤාසීහ මහ නාහිමියන් මේ පිළිබඳව වග කිව යුත්තනට කරුණු කාරණා ඉදිරිපත් කොට ලත් තැනම මේ වසංගතය ලොප් කරන්නට ඉදිරිපත් වූ හැටි මේ රටේ බෞද්ධ ජනතාවට අමතක විය නොහැක. ඊට අමතරව තවත් ස්වාමීන් වහන්සේලා කිහිප නමක් මෙන්ම ගිහි බෞද්ධයෝ ද විටින් විට පුවත්පත් ආදී ජනමාධ්‍යය ඔස්සේ වගකිව යුත්තනට කරුණු ඉදිරිපත් කළහ. එහෙත් බුදු සසුනෙහි මුර දේවතාවුන් වන මේ රටේ සකල සංඝ සංහතිය නම් කිසි විටෙකත් මේ පිළිබඳව එකමුතු වී හඬක් නැඟීයැයි කිව නොහැක. ඉඳහිට සම්මේලන ආදියේ දී බෞද්ධයින් ක්‍රිස්තියානි ආගමට හරවා ගැනීම ගැන ගිහි පැවිදි උදවිය අදහස් දක්වා ඇතත් ඒවා හුදෙක් කෙඳිරිගෑමක් පමණි.

කවර පක්ෂයකට අයත් වුවද, දේශපාලඥයා යනු හැම කෝවිලකටම, පන්සලකටම පල්ලියකටම පමණක් නොව දේවාලයකටම වඳින පුදන අනුග්‍රහය දක්වන අයෙකි. තම ඡන්ද පදනම ගැනම හිතන ඔවුහු මේ ප්‍රශ්නයේදී නොඇසූ කන්ව පසු වීම ගැන පුදුම විය යුතු නැත.




දේශපාලන පදනමක් සහිතව මේ විනාශකාරී ව්‍යාපාරය නතර කිරීමට නුදුරේදී අණ පනත් ගෙන ඒමට ද රජයෙන් කටයුතු සම්පාදනය වෙමින් පවතින බව දැනගන්නට ඇත. එහෙත් රහසිගත ව්‍යාපරයක කටයුතු නීතිරීති සම්පාදනයෙන් පමණක් මැඩ පැවැත්විය හැකිද යන්න සිතා බැලිය යුතු වෙයි. විනාශකාරී ව්‍යාපාරයක කටයුතු අණපනත් මගින් තරමක් දුරට මෙල්ල කළ හැකි වුවද කැමති ආගමක් ඇදහීම හා වැලඳ ගැනීම පුද්ගලයා සතු මිනිස් අයිතිවාසිකමක් වෙන හෙයින්, යම් යම් ලාබ ප්‍රයෝජන හා වරප්‍රසාද ඉදිරියේ, අණපනත් අතරින් රිංගා තම ව්‍යාපාර පවත්වාගන යාමට මෙම ව්‍යාපාරවලට හැකියාව ඇත.

බෞද්ධයින් ක්‍රිස්තියානි ආගම වැළඳ ගැනීමට මූලික හේතුව දුප්පත්කම හා නූගත්කමය. මේ අතර වෙනත් විවිධ පෞද්ගලික හේතු නිසා බුදු දහම අත් හරින උගතුන් හා පොහොසතුන් ද නැත්තේමයැයි කිව නොහැක.

සක්විතිටත් වඩා සූර ලෙස තම ග්‍රාහකයින් වංචා කළ දේශමාන්‍ය ආචාර්යවරයා බුදු දහම අතහැර ක්‍රිස්තියානිය වැළඳ ගත්තේ සල්ලිවලට ඇති කෑදරකම නිසාය. සෝම හාමුදුරුවන් අපවත් කිරීමට ද මුල් වී යැයි කියන මේ පව්කාරයාට අද සිදුවී ඇති දෙය ගැන මම නම් පුදුම නොවෙමි. දිට්ඨ ධම්ම වේදනීය කර්මය පල දෙනු මා දැක ඇති බැවිණි.

දුප්පතුන් අතර වුවද පවතින නූගත්කම හා මෝහන්ධකාරය දුරු කිරීමට සුදුසුම බලවේග ය සඟරුවන බවට සැකයක් නැත. තමන් වැඩ වසන ප්‍රදේශයේ වෙසෙන, විශේෂයෙන්ම දුප්පත් හා නූගත් ජනතාව සමඟ නිරන්තර සබඳකම් වගාකර ගනිමින්, මෙලොව පරලොව විමුක්තිය උදෙසා බුදු දහමින් ලද හැකි පිහිට මේ සඟරුවන විසින් කාරුණිකව පහදා දෙන්නේ නම්, ඔවුනගෙ දුක සැප සොයා බලමින් කටයුතු කරන්නේ නම්, කිසිම බලවේගයකට බොදුණුවන්ගේ සිත් වෙනස් කළ හැකි වෙතැයි මම නම් නොසිතමි.

ඒ කෙසේ වෙතත් බෞද්ධයින් අතර නිමල බුදු දහම පතුරවමින්, අසරණ, දුප්පත් බෞද්ධයින්ගෙ නැණ නුවන පහදන කලකිරී වෙනත් ආගමකට යොමු වීමේ අඳුරින් ඔවුන් ගලවා ගන්නට තම මුළු ශ්‍රමයත්, කාලයත් වැය කරන උතුම් හිමිවරුද අතළොස්සක් අප අතර සිටින බවද සඳහන් කළ යුතුය. බෞද්ධයින් ක්‍රිස්තියානි ආගමට හැරවීමේ සාර්ථක ව්‍යාපාරයක් දහම ඔස්සේම ව්‍යර්ථ කළ එක් අවස්ථාවක් ගැන සඳහන් කරන්නට මම කැමැත්තෙමි.



මෑත කාලයේදී පවුල් පනහක් පමණ ජීවත් වූ ඇඹිලිපිටියේ සූරියවැව ප්‍රදේශයේ එක් ගමක ඒ සියලු බෞද්ධ පවුල් ක්‍රිස්තියානියට හැරවීමේ ක්‍රියාවලියක් ඇරැඹිණ. ඉතා ප්‍රබල රාජ්‍ය නොවන සංවිධානයක පූර්ණ අනුග්‍රහය සහිතව ගම්වැසියනට කෑම, බීම, වස්ත්‍රාභරණ, ගොඩනැගිලි ද්‍රව්‍ය ආදිය අල්ලස් වශයෙන් ලබා දී පවුල් පනහම ක්‍රිස්තියානි ලබ්ධිකයින් කිරීමට මෙම ව්‍යාපාරය සමත් විය.

සේනාධීර නම් වූ එක් විශ්‍රාමික පින්වත් ගුරු පියෙක් මෙ ගම විසුවේය. මේ ගම තුළ හා වට පිටාවේ පල්ලි තුනක් ගොඩ නැංගවීමේ කටයුතුද ඇරැඹෙමින් තිබිණ. සේනාධීරයෝ මේ පිළිබඳව දැඩි කම්පාවෙන් පසු වූහ. නිවසක් හා සෑහෙන ඉඩ කඩම් ප්‍රමාණයක හිමිකරුව සිටි මෙතුමා මිය පරලොව ගිය පසු එතුමාගේ දරුවෝ පියාගේ ඉල්ලීම මත අපේ පින්වත් පූජ්‍ය කිදුබත්ගොඩ ඤාණානන්ද ස්වාමීන් වහන්සේට මහමෙව්නා අසපුවක් සඳහා නිවස සහ ඉඩම පූජා කළහ. උන්වහන්සේ එම නිවස භාරගෙන සූරියවැව මහමෙව්නා අසපුව ආරම්භ කළ සේක. එහි පාලනය පූජ්‍ය ගිංතොට විමල හිමියන්ට භාරවිය. මෙහි දී කළ යුතු වැදගත්ම කරුණ වූයේ බුදු දහම අතහැර ගිය පවුල් පනහ නැවත බුදු දහමෙහි පිහිටුවීමය. සේනාධීර මහතාගේ බලාපොරොත්තුව වූයේ ද එයමය.

පූජ්‍ය කිරිබත්ගොඩ ඤාණානන්ද ස්වාමීන් වහන්සේ විමල ස්වාමීන් වහන්සේට උපදෙස් දුන්හ. ඒ සෑමදාකම උදේ රැයින්ම එම ගමට පිඬු සිඟා වඩින ලෙසටය. පළමු දවසේ එම ගමට පිඬු සිඟා වැඩි විමල හිමියන්ටත් අනෙක් හිමියන්ටත් කිසිම දානයක් ලැබුණේ නැත. දෙවන දවසේත් එසේම්ය. උත්සාහය අත හැරියේ නැත. තුන්වන දවසේත් වැඩියහ. කිසිවක් ලැබුණේ නැත. එසේ වුවද ඤාණානන්ද හිමියන්ගෙන් ලැබෙන උපදෙස් මත දිනපතාම පිඬුසිඟා වැඩීම ද සිදුවිය.

දින කීපයකට පසු එක දිනයක කුඩා ළමයෙක් පැමිණ දන් ටිකක් පිළිගැන්වූයේය. ඊළඟ දවසේ එක් නිවසක සිටි කාන්තාවක් ද පැමිණ දන් ටිකක් පිළිගැන්වූවාය. දන් පිළිගන්වන විට වැඳ නමස්කාර කරන්නැයි ස්වාමීන් වහන්සේ පැවසූහ.

"නැහැ. අපි ක්‍රිස්තියානි. හා.වීමුරුවරුන්ට වඳින්නේ නැතැ" යි ඇය කීවාය.

"ඒකට කමක් නැහැ කොයි ආගමක වුණත් සිල්වත් භික්ෂුවකට වැඳීමෙන් පින් සිදු වෙනවා." උන්වහන්සේ පැවසූහ.

ඇය නමස්කාර කළාය. හැකි නම් මේ ළඟ ඇති අසපුවට පැමිණෙන ලෙසද ඉල්ලීමක් කළහ. එහෙත් කිසිවෙක් පැමිණියේ නැත. එසේ ටිකෙන් ටික දානය දීම ආරම්භ විය. දිනක් සවස කාන්තාවන් කිහිප දෙනෙක් ළමයින් සමඟ අසපුවට පැමිණියහ. ස්වාමීන් වහන්සේ කරුණාවෙන් ධර්ම කියා දීම ආරම්භ කළහ. උත්සාහය සාර්ථක විය. මාස හයක් ගත වන විට එම ගමේ සියලු දෙනාම නැවත බෞද්ධයන් බවට පත් වූහ.

ඔවුහු අසපුව විශාල කළහ. බුදුමැඳුරක් ඉදි කළෝය. එකවර පන්දහසකට වැඩි පිරිසකට ඉඩ සැලසෙන විශාල ධර්ම ශාලාවක් ද ඉදිවිය. ඊට දායක වීමට මට ද අවස්ථාව ලැබිණ. දැන් සෑම පෝයකටම පන්දහසකට වැඩි පිරිසක් සිල් සමාදන් වෙති.

කතෝලික පවුලක ඉපිද, වසරක පමණ වූ සරසවි ජීවිතයෙන් සමුගෙන, බොදු ජනතාව අතරට ගොස් නිහඬව සසුනට මෙබඳු සේවයක් කරන්නට තරම් පූජ්‍ය කිදුබත්ගොඩ ඤාණානන්ද හිමියන්ට ආත්ම ශක්තියක් තිබියදී අපේ අනෙකුත් හිමිවරු පිරිතට, මතක බණකට, පාංශකූලයට පමණක් තම සේවය සීමා කොට කාමසුඛල්ලිකානුයෝගී ජීවිතවලට නැඹුරු වීම මුලු මහත් බෞද්ධ ජනතාවගේ අභාග්‍යයකැයි සිතමි.

සසුනට කෙරෙන මෙබඳු මාහැඟි සේවාවන් අගයනු වෙනුවට අපේ ඇතැම් විද්වත් හිමිවරු 'ඉස්සරනං මහමෙවුනාවල් තිබුණෙ එකයි.. ඒත් දැන්නම් යන යන තැන්වල මහමෙවුනාවල්' යි සමච්චල් සහගත අදහස් ප්‍රසිද්ධියේ පළ කිරීම ගැන අප තුළ සංවේගයක් ද දු කක් ද හට ගනී. මේ නායක හිමිවරුන්ට හන්දියක් හන්දියක් ගානේ ඇති - ඉස්සර නං සිංහයාගේ ලකුණ ද යොදා තිබුණු තැබෑරුම් මෙන්ම මස් කඩ සහ තරුණ තරුණියන් අගාධයට ගෙනයන කොරකේ සමාජශාලා ද නොපෙනෙන්නේ ඒවාට ඇති කැමැත්ත නිසාදැයි නොදනිමි.

මහමෙවුනා අසපු කරා බොදු ජනතාව ඇදී එන්නේ මෙම ලිපියේ සඳහන් කළ සිදුවීම වැනි මහා ප්‍රාතිහාර්ය පිළිබඳව ඔවුන් තුළ පවතින පැහැදීම හා විශ්වාසය නිසාමය. ගමේ පන්සලේ අකටයුතු කම් හා විනය විරෝධී කටයුතු කෙරෙහි කලකිරෙන ජනතාව, අසපු කරා ඇදී යාම හෝ නූගත්කම නිසා අන්‍ය ආගමකට නැඹුරුවීම ගැන පුදුම විය යුතුද?

අද දිවයින පුරා මහමෙවුනා අසපු තිස්හතක් ඇති අතර දිනපතාම වගේ අලුතෙන් මහමෙවුනා අසපු පිහිටුවීම ද සිදු කෙරේ මෙයට අමතරව ඇමෙරිකාව, කැනඩාව, එංගලන්තය, ඔස්ට්‍රේලියාව, ජර්මනිය සහ ඉන්දියාව යන රටවල ද මහමෙවුනා අසපු පිහිටුවා තිබේ. අන්තර්ජාලය මාර්ගයෙන් ලෝකයේ සිටින ඕනෑම කෙනෙකුට බුදු දහම ඉගෙනීමට ද අවස්ථාව සලසා තිබේ. දැනට ඤාණානන්ද ස්වාමීන් වහන්සේගේ ශිෂ්‍ය පිරිස හාරසියය ඉක්මවා සිටිති. සිංහල පමණක් නොව මුස්ලිම් හා දෙමළ අයද පැවිදි බව ලබා සිටිති.

මේ එකම මහමෙවුනා අසපුවකවත් දේවාල නැත. විෂ්ණුලා, කතරගමලා, සායි බාබාලා නැත. ඒනිසා වඳින භාවනා කරන සැදැහැවතුන්ට බාධා කරමින් අදෝනා නඟින කපුවෝද නැත. පිරිත් නූල් විකුණන නූල් කඩ ද නැත. විශ්වවිද්‍යාලවල ඉගෙන ගන්න හෝ උගන්වන ශ්‍රමණ ප්‍රතිරූපකයින් නැත. හොර මැඩම්ලා ද නැත. ඒ නිසා දරුවන් ද නැත. ආධාර එකතු කරන පිං පත්තර ද නැත. ඊනියා භික්ෂුණියන් ද නැත. පාර්ලිමේන්තුවට යන්නට, දේශපාලන වේදිකාවලට යන්නට පෙළපාලි ගොස් ඔලු පලාගන්නට සුදුසුකම් තියෙන ගෝල හාමුදුරුවරු ද නැත. යන්ත්‍රමන්ත්‍ර ගුරුකම් නැත. කොණ්ඩය වවාගත්ත, බ්‍රීෆ්කේස් එකක් එක් අතකින් එල්ලාගෙන අනික් අතින් මොබයිල් ෆෝනයෙන් කතා කර කර පාරේ යන චීවරධාරීන් ද නැත. ඝග එග ජාලා ද නැත. සියලු රස්තියාදු කාරයින් සඳහා රූපවාහිනී ද නැත. ඒ නිසා සුපර් ස්ටාර්ලා ද නැත. හන්දියේ වාහන හසුරුවන ට්‍රැෆික් පොලිස් රාළහාමිලා මෙන් අත් දෙක එහාට මෙහාට කරමින් සුළං තල්ලු කරන විශ්ව ශක්ති කාරයෝ ද නැත. බුද්ධ සාසනයේ පැවැදිවීමේ පරමාර්ථය කුමක්දැයි නොදැන විවිධ ව්‍යාපාරවල යෙදෙමින් පසුගියදා බංකොලොත් වුණු බැංකුවල, විශාල වශයෙන් පිං සල්ලි තැන්පත් කර ඒවා ද පිනට දුන්නා යැයි සිතා සැනසෙන්නට සිදුවී ඇති හාමුදුරුවරුද නැත.

එහෙත් එක් පිරිසක් සිටිති. නියම බුද්ධ ධර්මය හඳුනාගන්නට, මේ ජීවිතයේදීම විමුක්තිය ලබාග න්නට වෙහෙසෙන බාල තරුණ මහලු පිරිසයි ඒ. ඔවුන් පැමිණෙන්නේ අවබෝධයෙන්ය. දස දහස් ගණනින්ය. මෙය කියවූ ඔබට තෙරුවන් සරණත් මහමෙවුනාවේ පිහිටත් මෙත් සිතින් පතමි.

දයාවංශ ජයකොඩි

dayawansa@dayawansajayakody.com